එම කැහැටු බැළලියට එල්ල කළ දර පොලු පහර ඉන්තේරුවටම වැදුනු බව ඇය දුටුවාය. ඒ සමඟම බැළලියගේ මුවින් පිටවුණු වේදනාකාරී රිදුම් කෙඳිරයද ඈට ඇසුණාය. එහෙත් වැසිකිළි වහලෙන් කෙටි බිත්තියට පැන අනෙක් වත්තට පලා ගිය බැළලියගේ කටේ එල්ලී තිබූ තලපත් මාළු කෑල්ලනම් බිමට නොවැටුණු විත්තිය ඈට තේරිණි. ඒ දරුණු පොලු පහර කාගෙනම උෟ මාලු කෑල්ලත් රැගෙන කොහාට පළා ගියාදැයි ඈට නොපෙණිනි. එය ඇත්තටම අදෘෂ්‍යමාන බලවේගයක් විසින් උෟ අතුරුදන් කළා වැනිය. වහලවල්, බිත්ති, කටු පඳුරු අට්ට ලොට්ට බොහෝමයක් ඇති ඒ කලබලකාරී පසුබිමක උෟ කොහේ හරි හැංගී මාළු කෑල්ලේ රස බලනු ඇතැයි ඈට සිතිනි. ඇය තාප්පයට අත තබා ඉස්සී අවට විපරම් කළාය. එහෙත් බැළලියනම් පේනතෙක් මානයක නැත. ඉනික්බිති ඈ අනෙක් වත්තේ කම්බි වැටෙන් රිංගා අවට විපරම් කළාය. එහෙත් වූ පෙනෙන්ට නැත. නැවත් කුස්සියට රිංගා ඇය තලපත් මාළු කෑල්ල තිබූ බාජනයත් ඒ වටේ ඇති ලූණු මිරිස් කරප් දෙසත් බලා සුසුම් ලන්නට විය. එම හිස් බාජනයත් ලූණු මිරිස් කැබලිත් ඇයට දැන් පෙනෙන්නේ සමච්චලයට සිනාසෙන මිනිසුන් රැසක් පරිද්දෙනි. ඇය ඒ දෙස බලා කේන්තියෙන් දත් මිටි කෑවාය.

මේ හඩු බැළලි කාගෙ එකෙක්ද ? කිසිදාක දැක නැති මූ කුස්සියට රිංගුවේ කෙසේද ? යන පැනයයි. පිළිතුරු සෙවීමට වෙහෙසුණු අය කුස්සිය සිසාරා තම දෑස් යොමු කළාය. තැන් තැන්වලින් සුළං කපොලු තබා ඇති ගඩොලක් බුරුල් වී එවැනි සතෙකුට එන්නට තරම් සිදුරක් සෑදී ඇති බව අද දුටුවාය. උෟ එයින් රිංගා එන්නට ඇතැයි අද අනුමාන කළාය.

"මට මේ හිරේ විලංගුවේ කෑම කාල එපාවෙලා තියෙන්නේ මධුරංගනී පුළුවන්නම් මට ඉඳලහිටලවත් කෑම ටිකක් උයලා ගෙනත් දීපන්. අර උඹගෙ උතින් උයන රස්නෙන් තවපු කෙසෙල් කොලේ ඔතන බත් ගෙඩිය එනවෙලාවට ඔයා

# ගැහැනියක් සහ බැළලියක්



අනම් මනම් උස්සන් එන්නේ නැතිව මට කන්න බත් ටිකක් අරන් වරෙන් මධුරංගනී"

බන්ධනාගාර නිළධාරියා විසින් රැකවල් දා සිටින ඒ සීමිත කාල වේලාව තුළ තම සැමියාගේ අවසන් ඉල්ලීමට ඇය හිස සැලුවේ තමා දෙස බලා සිටින නිළධාරියා දෙසද වරින් වර බලමිනි. බරපතල වැඩ ඇතිව දස වසරක හිර දඬුවමක් නියම වී සිටින සුමනේ බලන්න ආවේ කෙසේ හෝ මුදලක් සොයාගෙන රසවත් කෑම වේලක්ද සමඟිනි. එහෙත් තමාගේ අසනීප තත්වයන් හා ඒ සමඟම මුහුණ දෙන්නට සිදුවූ ආර්ථික ප්‍රශ්ණ හමුවේ ඈ අසරණ විනි. සැමියාගේ දෑස් දෙස බලා සිට පිටවෙන්නට හදන මොහොතේ ඇගේ දෑසට කඳුලක් නැගුනේ නිතැතිවමය. අ ෑඑය කම්මුල් දිගේ ගලයන්නට නොදී ආයාසයෙන් වැඩ ගත්තාය. ඒ වනවිටත් කාලය අවසන් බැව් නිළධාරියා දැනුම් දුන්නේ දෙවන වතාවටය. අද බන්ධනාගාරයෙන් එළියට විත් පාර පැන පදිකවීදිය දිගේ ඇවිදගෙන ගියේ ළඟදීම හොඳ කෑම වේලක් සමඟ සුමනේ බලන්නට ආ යුතුයැයි අදිටන් කරමිනි. දියණිය ලැබෙන්නට සිටිනා කාලයේ, සුමනේ ඇගේ දොළදුක සන්සිදුවීමට ගත් උත්සාහය මතකයට විත් ඒ මතකය අතීතය කරා රැගෙන ගියේය. සුමනේ තමාගේ ඉල්ලීම කිසි ලෙසකින්වත් මඟ හැරියේ නැත. ඈ පදික වීදිය දිගේ ගොස් බස් නැවතුමේ නතර වුණේ ඒ ගැන සිතමිනි. දිනක් ඇගේ සිතට උපන් අළුත් රසක් පිළිබඳ ඈ සුමනෙට පැවසුවාය.

"සුමනේ මං හරි ආසයි දැල්ලො තෙල් දාලා කන්න"

ඔහු නිහඬව සිනාසෙන අයුරු ඈ දුටුවාය. දොළදුක් ගාය සංසිඳෙන තෙක්ම ඇයට කන්නට සිතුනු සෑම දෙයක්ම සුමනේ නොවරදවාම ලබාදුන් බව ඈට මතකය. මෝරන කුස දෙස බලමින් සුමනෙ සතුටින් හිනැහුනේය. මේ කුස තුල දඟලන දරුවාගේ හැල හැප්පීම් බලන්නට මෝරන කුසට සවන් තද කර අසා සිටින සුමනේගේ රුව ඈත සිට හඹා ආ දූවිලි සුළං රැල් අතරින් ඈ දුටුවාය. ඔයාගේ සතුට කියන්නේ දරුවගේ සතුට. ඒක මගෙත් සතුට. ඒකනේ පැටියා බඩ ඇතුලේ පිනුම් ගහන්නේ. එසේ කියන සුමනේ මහ හඬින් සිනාසෙන හැටි අදටත් පෙනේ.

එහෙත් අලුත උපන් දියණියගේ කිරි සුවඳ ගේ පුරා තිබුණේ දින කිහිපයක් පමණි. සොයාගත නොහැකි රෝගයකින් පෙලුනු දියණියගේ ලෙඩදුක් සුව කරන්නට සුමනේ දහඅතේ නය විය. ඒ සමඟම ඔහුට රැකියාවද අහිමි වූයේ දියණිය



ලක්ෂ්මන් කොඩිතුවක්කු

වෙනුවෙන් කාල වේලාව වෙන් කොට වෛද්‍යවරු හා මුදල් සොයමින් දස අතේ කරක්ගැසූ ප්‍රතිඵලයක් ලෙසින් ඇගේ ලෙඩදුක් සුව කරන්නට ඕනෑම කැපවීමක් කරන්නට සුමනේ සැහැදී පැහැදී සිටියේය. සමහර වෛද්‍යවරුන් සුවකළ නොහැකි බව පවසන විට තවත් වෛද්‍යවරු පැවසුවේ දියණිය සුවකළ හැකි බවකි. නමුත් ඒ

**බයිසිකලයේ හැඩලය එක් වරම තනි කකුලෙන් නැවැත්වූ මාළුකාරයා මාළු පෙට්ටිය විවරකර එම ලෑල්ලේම අතුල්ලා පිහිය මුවහත් තිබ්බේ තරමත් ලිහිල් වී පෙනෙන තම හැට්ටකර ඇතුළට කෑදර බැල්මක් හෙලා බව ඈ දුටුවාය. එහෙත් ඇය ඒ බව නොපෙන්වා ඔහුට සිත්සේ ලැම පෙදෙස බලන්නට ඉඩ දුන්නේ තරමක් හෙට්ටු කර මාළු කෑල්ල ගැනීමේ අදහසිනි.**

වෙනුවෙන් යට කිරීමට සිදුවන මුදල් කන්දරාව ගැන සිතමින් තමාත් සුමනේත් හූල්ලපු දින ගණන් මතකයට විත් ඇගේ හිස එහාට මෙහාට ගාටන වාහන නලා හඬ දුන් ගඳ හමුවේ කැරකෙන්නට පටන් ගත්තාය. එහෙත් සුමනේ කිසිවක් නොපවසා මුනිවත රකිමින් අධිෂ් ඨානශීලී හැඟුමින් හිටි රුව ඈට මතකය. එලෙසම ඒ දින ගණන් තුල ඔහුගේ නිහඬතාවයද ඈට ප්‍රහේලිකාවක් විය. එක් රාත්‍රියක ඔහුගේ නොපැමිණීම ඇයගේ සිතට විශාල බියක් ගෙනදුන්නාය. ඇය දියණියට තුරුළු වී දෙවියන් යැද්දාය. එහෙත් එදා හිමිදිරියේ ඇගේ සවනට වැකුනේ නරක ආරංචියකි. සිදුවූයේ කුමක්ද යන්න ඇයට අද වෙනතුරු හරි හමන් අවබෝධයක් නැත. ඇය දන්නේ සුමනේගේ අතින් එම ධනවත් මුදලාලි මියගිය බව පමණිකි.

එක් එක් අයගේ කටකතා වලට අනුව නම් එම රාත්‍රියේ නිවසේ සිටි සැපවත් බල්ලාගේ උඩු බිරුම් හඩට අවදි වූ මුදලාලි සුමනේට පෙර ඉක්මන් වූ බවකි, ඔවුන් පවසන්නේ එහෙත් මුදලාලිට වඩා සුමනේ සවිමත් වූ බැවින් එම සටනින් සුමනේ ජයගත් බවකි. තවකෙකු පවසන්නේ සිදු වු දෙය දන්නේ ඔහු පමණි. තවමත් එම සිදුවීම ඇයට පැහැදිලිව නොපවසන සුමනේ කදුළු වගුරන්නේ තමා අතින් ජීවිතයක් අහිමි වීමේ පාප කර්මයටය. සුමනේට දඬුවම් ලැබෙන්නට ප්‍රථම දියනියද මිය ගියාය. සියල්ල අහිමි වී තනිවූ ඇය අතට හසුවන කුමක් හෝ රැකියාවක් කර ඩීවිතය ගැටගසා ගන්නට වෙහෙස ගත්තාය.

ඇය තලපත් මාළු කෑල්ල මිලදී ගත්තේ ඒ ඉතිරි කරගත් මුදලෙනි. මාළු කාරයාගේ කටහඩ ඇහෙනතුරු විමසිල්ලෙන් සිටි ඇය ඒම මාළු මාළු හඩ ඇසෙනවිටම මිදුලට ආවාය.

"මට හොඳ තලපත් මාලු කෑල්ලක් දීපන් මල්ලියේ සුමනේ අයියට කාලෙකින් බත් ටිකක් ගෙනියන්න බැරිවුණා."

බයිසිකලයේ හැඩලය එක් වරම තනි කකුලෙන් නැවැත්වූ මාළුකාරයා මාළු පෙට්ටිය විවරකර එම ලෑල්ලේම අතුල්ලා පිහිය මුවහත් තිබ්බේ තරමත් ලිහිල් වී පෙනෙන තම හැට්ටකර ඇතුළට කෑදර බැල්මක් හෙලා බව ඈ දුටුවාය. එහෙත් ඇය ඒ බව නොපෙන්වා ඔහුට සිත්සේ ලැම පෙදෙස බලන්නට ඉඩ දුන්නේ තරමක් හෙට්ටු කර මාළු කෑල්ල ගැනීමේ අදහසිනි. ඔහුගේ මුවින් වහනය වන මත්පැන් ගඳ ඇයට දැනුණි. දැනටනම් බීමත්කමක් නොපෙන්වන ඔහුගේ තද රත්පැහැ ඇස් ඉදිමී පෙනෙන්නේ නිතිපතා ඔහු මත්පැන් වලින් පදම් වන බවකි. මාළු කෑල්ල ඔතා අතට දෙන ගමන් ඔහු ඇගේ ඇඟිලි මිරිකුවේය. ඈ එය නොදැනුණු බව අගවා "කීයද මල්ලියෙ අලාභය" යැයි ඇසුවේ හිතට ආ කෝපය මැඩ ගනිමිනි.

"ඔන්න ඔය කීයක් හරි දෙන්න අක්කෙ අක්කටයි මටයි ඕක කෝම වුණාම මොකෝ. "

හිතුවාටත් වඩා අඩු මුදලකට ඇයට මාළු බෑල්ල ලැබුණි. ඇය නිවස ඇතුළට යන්නට පෙර මාළුකාරයාගේ කටහඩ නැවත ඇසුණි.

"කවද්ද සුමනා අයියා ගෙදර එන්නේ?" එයට ඇයගෙන් ලැබුණේ නිහඬ පිළිතුරකි.

"දැන් ඉතිං කවද ආවාම මොකෝ. මං ආපහු මේ පැත්තෙන් හෙට අනින්දා එනවා. එනකොට තව හොඳ' මාළු කෑල්ලක් අරන් එන්නම්කො... සුමනෙ අයියට නොදෙන මාළු වලින් වැඩක් තියෙනවාද? නැද්ද අක්කෙ දං අහන්නේ." ඈ බලා සිටියාය. ඒ ඉඟි මැරීම තුළ ඇත්තේ මාළු කෑල්ලක් වෙනුවෙන් තම පහස ලබා ගැනීමට වෙහෙසෙන සල්ලාලයෙකුගේ ඉරියව් බව ඕ පසක් කර ගත්තාය.

මාළු කෑල්ල ඇතිලියට හලා ඈ එදෙස බලා උන්නේ සුමනෙගේ මතකයන් හා ඒ අතීතයේදී ඔහුගෙන් ලැබුණු උණුහුම නැවත නැවතත් සිහිපත් කරමිනි. ඒ අතරින් මාළු කාරයාගේ රුවද ඈ දුටුවාය. ඒම මාළු කෑල්ල ඇතිලියේම තිබෙන්නට හැර ඈ අසල කඩයට ගියේ හොද්දට අවශ්‍ය කළු තුනපහ, මිරිස් කරල් හා දෙහි ගෙඩියක් ගැනීමේ අදහසිනි. ඒ කිසිවක් කුස්සියේ නැති බව ඇයට මතක් නූයේ පසුවය. එහෙත් කඩේට ගොස් එන විට අතිලියේ තිබූ මාළු කෑල්ල අතුරුදන් තිබුණි. ඒ වන විටත් ඒ කැහැටු බැල්ලිය තාප්පය උඩ සිට මාළු කෑල්ල රස බලන හැටි ඇය සැනෙකින් දුටුවාය. ඒ අසලම ඇති දර පොල්ලක් ගෙන එළියට බැසගත් ඈ විදුලි වේගයෙන් උෟ වෙතට එය මුදා හැරියේ හිතේ කෝපය දෙගුණ තෙගුණ කරමිනි.

"තමා වැරදිකරුද? නිවැරදිකරුද?........" සුමනේ නිහඬය.

"අවසන් වරට තමාට මොනවද කියන්න ඇත්තේ ?"

"මොකුත් නැහැ ස්වාමීනි"

එදා අවසන් නඩු තීන්දුවේදී සුමනේගේ කටහඬින් ඇසුණු පිළිතුර ඇගේ මතකයට ආවේය. ඒ සමඟම ඇයට ඒ කැහැටු බැළලියගේ රුව නැවත පෙනේ. සමහර විට උෟට අයිතිකරුවෙක් සිටිය හැක. ඔහු මා සොයා ගෙන ආවොත්? ඇය නැවතත් මිදුලට බැස වටපිට බැලුවාය. මිනිසුන් රැනක් තමාව වට කර ගන සිටින්නා සේ ඈට පෙනේ.

"මාළු කෑල්ලක් වෙනුවෙන් අහිංසක බැළලියකගේ ලේ හලන්න තරම් තිරිසන් වුණාද ?"

"අවලන් බැළලියකට වැඩිය ඒ මාළු කෑල්ල මට වටිනවා . මම කොච්ර පෙරුම් පුරලා මොනතරම් අමාරුවෙන් ද ඒ මාළු කෑල්ල සල්ල දීලා ගත්තෙ."

තමුන් දැන ගන්න ඕන මාළු කෑල්ල පරිස්සම් කරගන්න. සතෙකුට වැඩක් නැහැ කාගෙද මාළු කෑල්ල කා වෙනුවෙන්ද කියල හොයන්න. උෟ බලන්නෙ උගෙ බඩගින්න තුනී කරගන්නෙ කොහොමද කියන එක විතරයි. උෟ වෙනුවෙන් අපි යනවා පොලිසියට. උෟ අපි ආදරෙන් ඇති කරන බැළලියක්. ඈ දෑස් පිසදා එම මිනිසුන් දෙස බැලුවාය.

"මොකද අක්කා කල්පනා කරන්නෙ" මිනිසෙකු ඇගෙන් අසයි. අක්කා බළලෙක් හෙව්වද? මාළු කෑල්ලක්ද? මොකක්ද උස්සන් ගියා කියල අන්න අර පඳුර ගාව උෟ වැටිලා පණ අදිනවා. හොද පාරක් උෟට වැදිල තියෙන්නෙ.

ඈ මිඳුලට බැස ඔවුන් කියූ ඉසව්ව දෙසට දිව්වාය. බැළලිය පොළොවේ වැතිරී අවසන් හුස්ම පොද පිට කිරීමට දරණ වෙහෙසත්, උෟ වටේ තෙරපෙමින් අඬා වැටී කිරි උරන්නට වැර දරණ පැටව් රැනකගේ රුවක් දුටු ඇගේ පපුව හෝස් ගා පත්තු වී දැවෙන ගිණි කඳක් බවට පත්වූයේ නෙතින් පිටවූ කඳුළු බිඳු කිහිපයක්ද සමඟිනි. පැටව් බැළලියගේ තනපුඩු උරමින් දඟලන්නේ ඒ "ශ්‍රාව්" හඬ ශෝකී රාවයක් බවට පත් කරමිනි. බැළලියගේ හිසින් තවමත් ලේ ගලයි. ඒ හිසට යටවී ඇත්තේ අඩක් කා ඉතිරි වූ කුණු රොඩු දූවිලි බැඳුණු අඳුරු පැහැගත් මාළු කෑල්ලකි. ඈ ඒ දෙස බලමින් ඉකි බිඳින්නට වූවාය.